**බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**
**අන්තර් කලායතන තරගාවලිය -2025**
**කලායතන තරග සඳහා අයදුම් කිරීමේ සුදුසුකම් හා පොදු කොන්දේසි**

**01.** මෙම තරගාවලිය සඳහා ඉදිරිපත් වන සෑම තරගකරුවෙක්ම /තරගකාරියක්ම බස්නාහිර පළාතෙහි ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. තරගයට ඉදිරිපත්වීමට පෙර තරගකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය, (ඉහත සඳහන් අනන්‍යතාව පලකරන වලංගු සහතිකයක්) හෝ උප්පැන්නයේ සහතික කරන ලද පිටපතක් සමඟ ග්‍රාම නිලධාරී විසින් සහතික කළ මෑතකදී ලබාගත් ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතුය.
**සැ.යු - තරගයට ඉදිරිපත් වීමේදී ඉහත ලේඛන ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.**

**02.** තරගාවලිය සඳහා ඉදිරිපත් වන සියලු කලායතන සංස්කෘතික දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කලායතන විය යුතු ය.

**03.** තරග අයදුම් පත්‍රය කලායතනාධිපති විසින්ම අත්සන් කර නිල මුද්‍රාව තබා, බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරිගේ නිරීක්ෂණ හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව පහත සඳහන් ලිපිනයට, අයදුම්පත් කැඳවා ඇති අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නැත්නම් සංස්කෘතික නිලධාරී මඟින් අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

**04.** බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන හොරණ කලාකෙත සංස්කෘතික මධ්‍යස්ථානයටද මෙම තරගාවලිය සඳහා අයදුම් කළ හැකි අතර, තරග අයදුම් පත්‍රය ස්ථානභාර නිලධාරී විසින් අත්සන් කර අමාත්‍යාංශ සහකාර ලේකම්ගේ (සංස්කෘතික) නිර්දේශ සහිතව පහත සඳහන් ලිපිනයට, අයදුම්පත් කැඳවා ඇති අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ සංස්කෘතික නිලධාරී මගින් අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

**05.** නර්තන සහ සංගීත තරග සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

**06.** එක් එක් තරග ශීර්ෂ සඳහා ඉදිරිපත් වන සිසුන්ගේ වයස් සීමා එකී තරග ශීර්ෂ යටතේ සඳහන් කර ඇත. අදාළ වයස් කාණ්ඩයට අයත් නොවන සිසුන්ට ඒකී තරගයන්ට ඉදිරිපත්විය නොහැකිය. සහය වාදන, ගායන කටයුතු සඳහා සහභාගී වන කණ්ඩායම සම්බන්ධයෙන් මෙම වයස් සීමාව අදාළ නොවේ.

**07.** එක් කලායතනයකට එක් තරග ශිර්ෂයක් සඳහා ඉදිරිපත් විය හැක්කේ, ඒකල තරග අංශයක් නම් එක් අයෙක්ටද, සාමූහික තරග අංගයක් නම් එක් කණ්ඩායමක් වශයෙනි.

**08.** ප්‍රාදේශීය ලේකම්ගේ/ සහකාර ලේකම්ගේ (සංස්කෘතික) නිර්දේශය සහිතව අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමෙන් පසුව තරග ශීර්ෂ වෙනස් කරන්නේ නම්, තරග පැවැත්වීමට සති 02 කට පෙර එසේ සිදුකළ හැකි අතර, ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය අවශ්‍ය වේ. තරගය පැවැත්වෙන දිනය තුළ අයදුම් කළ තරග හැර වෙනත් තරග වලට ඉදිරිපත්වීමට අවස්ථාව දෙනු නොලැබේ.

**09.** කිසියම් සිසුවෙකු කලායතන කිහිපයක ඉගෙනුම ලැබුවත් තරග සඳහා ඉදිරිපත් විය හැක්කේ එක් කලායතනයකින් පමණි.

**10.** සමූහ තරග සඳහා අතිරේක ශිල්පීන් සිව් දෙනෙකු නම් කළ හැකිය. එම ශිල්පීන්ගේ නම් තරගය සඳහා ඉදිරිපත් නොවුවද, තරගයට සහභාගී වූ තරගකරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කළ යුතුය.

**11.** කිසියම් තරග අංශයක් සඳහා පළමු, දෙවන හෝ තෙවන ස්ථාන ලබාදීමට තරම් සුදුසු තත්වයක නොමැති නම් ඒ බව නිර්දේශ කිරීමට විනිශ්චය මණ්ඩලයට බලය පැවරෙනු ඇත.

**12.** යම් තරග අංශයක් සඳහා ප්‍රමාණවත් අයදුම්පත්‍ර ප්‍රමාණයක් නොලැබුනි නම්, එම තරගය නොපැවැත්වීමේ බලය අමාත්‍යාංශ ලේකම්වරයා සතුවේ.

**13.** තරග පැවැත්වෙන දිනය හා වේලාව අමාත්‍යාංශය මගින් ලිඛිතව දැනුම් දෙනු ලැබේ. ඉල්ලුම් කළ තරගයට ඉදිරිපත් වීමට විනාඩි 15කට පෙර අදාළ විනිශ්චය මණ්ඩලයෙහි සම්බන්ධීකරණ නිලධාරීන් මගින් සිසුන්ගේ අනන්‍යතාවයන් තහවුරු කර ගත යුතුය. **අදාළ ලේඛන කණ්ඩායමෙහි සාමාජිකයෙකු මගින් සම්බන්ධීකරණ නිලධාරී වෙත ලබා දිය යුතු අතර කලායතනාධිපති ඊට සම්බන්ධ නොවිය යුතුය.**

**(සැ.යු. මින් පෙර අවස්ථා කිහිපයකදීම ඇතිවූ ගැටළුකාරී තත්වයන් හේතුවෙන් තරග පැවැත්වෙන අවස්ථාවේදී, අදාළ සිසුන් කණ්ඩායම හැරුණුකොට කලායතනාධිපතිවරුන් හෝ දෙමාපියන් එම ස්ථානයට නොපැමිණිය යුතුය.)**

**14.** තරග සඳහා ඉදිරිපත් වීමට ලබා දෙන නියමිත වෙලාවට ඉදිරිපත් නොවී ප්‍රමාද පැමිණෙන තරගකරුවන්ට තරගය සඳහා ඉදිරිපත්වීමට නැවත අවස්ථාවක් ලබාදෙනු නොලැබේ.

**15.** තරග අංශ සඳහා සහාය ගායනය හා වාදනය වෙනුවෙන් කලායතනාධිපතිවරුන්ට සහභාගි විය නොහැක.

**16.** මෙම තරගාවලිය පිළිබඳ විරෝධතාවයන් ඇත්නම් අදාළ තරග ශීර්ෂයේ සියලු ඉදිරිපත්කිරීම් අවසන්ව විනාඩි 20ක කාලයක් තුළ එය, සිය අනන්‍යතාවය සහිතව ලිඛිතව සංවිධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු අතර, අනන්‍යතාවය රහිත සහ පසුව ලබාදෙන විරෝධතා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**17.** තරගය පැවැත්වෙන අවස්ථාවේදී එම තරග පටිගත නොකළ යුතුය.

**18.** තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය පත්කරනු ලබන්නේ අමාත්‍යාංශ ලේකම් විසිනි. විනිශ්චය මණ්ඩල මගින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. තරග අංගයක් ඉදිරිපත් කිරීමේදී එහි කාල කළමනාකරණය සුවිශේෂී වේ. ඒ ඒ තරග ශීර්ෂයන්ට අදාළ නියමිත කාල සීමාවන් උපදෙස් පත්‍රිකාවෙහි සඳහන් වේ.ඒ අනුව නියමිත උපරිම කාලයට අමතරව ලබාදී ඇති සමාකාලය(තත්පර 30) ඉක්මවන තරගයන්, අදාළ තරග නීති උල්ලංඝනය කිරීමක් ලෙස සලකා තරගයෙන් ඉවත් කෙරේ.

**19.** ජයග්‍රහන හිමි කලායතන වෙත ලැබෙන සම්පූර්ණ මුල්‍ය ත්‍යාගය, සහභාගීත්ව දීමනාවට වඩා අඩු අගයක් ගන්නේ නම් එම කලායතන සඳහා සහභාගිත්ව දීමනාව ද හිමිවේ.

**20.** සහභාගීත්ව දීමනාව ලබා ගැනීම සඳහා අවම වශයෙන් තරග අංශ 3කට හෝ ඉදිරිපත් විය යුතු අතර, ඉන් අවම වශයෙන් සමූහ තරග එකකට හෝ සහභාගී විය යුතුය. මෙම කොන්දේසිය බෙර වාදනය පමණක් විෂය කරගත් කලායතන වලට පමණක් අදාළ නොවේ.

**21.** ඒකල හා යුගල තරග ශීර්ෂවලදී පමණක් අදාළ ප්‍රථම ස්ථානයට හිමි සම්මානය තරගය සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවට ද මුල්‍ය ත්‍යාගය කලායතනය වෙත ද පිරිනැමේ.

**22.** ඒකල තරග අංශයන් සඳහා අයදුම් කිරීමේදී ආසන්න වර්ෂ දෙකකදී ප්‍රථම ස්ථානය ලබාගත් ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවට මෙම වර්ෂයේදී එම ඒකල තරග අංශය සඳහා අයදුම් කල නොහැක.
**(උදාහරණ : 2023 හා 2024 වර්ෂයන්හි යම් ඒකල තරග අංශයකින් ප්‍රථම ස්ථානය ලබාගත්තේ නම්, 2025 වර්ෂයේදී එම ඒකල තරග අංශයට අදාළ තරගකරුවාට/ තරගකාරියට ඉදිරිපත් විය නොහැක.)**

**23.** තරග පැවැත්වෙන දින එම පරිශ්‍රයේ පූර්ව පුහුණු කටයුතු සිදු කරන බව අමාත්‍යාංශය වෙත නිරීක්ෂණය වී ඇති අතර, එය තරග සංවිධාන කටයුතුවලට බාධාවක් වන බැවින් එදින එම පරිශ්‍රයේ පුහුණු කටයුතු සිදු කිරීම සපුරා තහනම් වේ. එසේ නොවීමට කලායතනාධිපතිවරුන් විසින් තම පූර්ණ අවධානය යොමු කළ යුතුය.

**24.** තරගාවලිය පුරා කලායතනාධිපති/ මධ්‍යස්ථානාධිපති ඇතුළුව සියළුම තරගකරුවන් ඉහළ විනයක් හා සංයමයකින් යුක්තව හැසිරීම අනිවාර්ය වේ. එකී කොන්දේසි කඩ කරන්නේ නම් තරගවලට සහභාගී වීමට ඉඩ නොදීම, සහභාගී වූ තරග වලින් ඉවත් කිරීම, ඉදිරියේදී පැවැත්වෙන කලායතන තරග සඳහා අයදුම් කිරීමට ඉඩ නොදීම යන දඬුවම් වලින් එකක් හෝ කිහිපයකට යටත් කිරීමට සිදුවේ.

**25.** තරග පැවැත්වෙන කාලය පුරා තරගාවලියට, විනිශ්චය මණ්ඩලයට සහ සංවිධායක කමිටුවේ කාර්යභාරය සඳහා බාධාවන ලෙස කලායතන නියෝජනය කරනු ලබන පිරිස්, දෙමාපියන්, සිසුන්, ගුරුභවතුන් තරග පැවැත්වෙන ස්ථානයට නොපැමිණිය යුතුය.

**26.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2025 අප්‍රේල් මස 10 දින වේ.

**27.** තරගකරුවන්ගේ වයස් සීමාව 2024 දෙසැම්බර් 31 දිනට ගණනය කරනු ලැබේ.

- අවුරුදු 15 -21අතර 2003.12.31 දින සිට 2009.12.31දින දක්වා උපන්
- අවුරුදු 14 -21 අතර 2003.12.31 දින සිට 2010.12.31දින දක්වා උපන්
- අවුරුදු 12 -21 අතර 2003.12.31 දින සිට 2012.12.31දින දක්වා උපන්
- අවුරුදු 15 -18 අතර 2006.12.31 දින සිට 2009.12.31දින දක්වා උපන්
- අවුරුදු 14 න් පහළ 2010.12.31 දිනට පසු උපන්
- අවුරුදු 12 න් පහළ 2012.12.31 දිනට පසු උපන්

**28.** දිස්ත්‍රික් තරග 2025 ජුනි සහ ජුලි යන මාසයන්හීදී පැවැත්වීමට යෝජිතය.

**29.** වැඩි විස්තර දැනගැනීම සඳහා බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ දුරකතන අංක 011-2093105 හෝ 011-2093091 සහ තිසරු කෝට්ටගේ මෙය (සංස්කෘතික නිලධාරි) 0716332797 මධුෂා චාමරී මිය (සංවර්ධන නිලධාරි) 0711520937ද ඔබට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරී/ සංවර්ධන නිලධාරී මගින් දැනගත හැකිය.

**30.** මෙම චක්‍රලේඛය හා අදාළ අයදුම් පත්‍රය මෙම අමාත්‍යාංශයේ www.moe.wp.gov.lk දරන වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

**31.** අයදුම්පත්‍ර යොමු කිරීමේදී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ***"බස්නාහිර පළාත් අන්තර් කලායතන තරගවලිය 2025 "*** යන්න සඳහන් කළ යුතුය.

**32.** අයදුම්පත්‍ර යොමු කළ යුතු ලිපිනය :

**ලේකම්**
**අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)**
**2 වන මහල,**
**නො. 204,**
**නව පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,**
**ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,**
**බත්තරමුල්ල.**